මගේ අංකය:ඊටී/1(8)/G –IX (අභ්‍ය. උ. නව)

ජාතික තරුණ සේවා සභාවේ සියලුම කාර්ය මණ්ඩලය වෙත,

**ජාතික තරුණ සේවා සභාවේ පුරප්පාඩුව පවතින මාණ්ඩලික හා මාණ්ඩලික නොවන තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.**

ජාතික තරුණ සේවා සභාවේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයගෙන් අභ්‍යන්තරිකව අයදුම්පත් කැඳවනු ලැබේ.අයදුම්කරුවන් පහත දැක්වෙන ආකෘතියේ දැක්වෙන පරිදි සකස් කල අයදුම්පත්‍ර තම ආසන්නතම අධීක්ෂණ නිළධාරියාගේ නිර්දේශ සහිතව **2021.05.03** දින හෝ එදිනට පෙර ප්‍රධාන කාර්යාලයේ ආයතන අංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදිය යුතු අතර, එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.මෙම උසස් වීම් සම්බන්ධයෙන් කිසියම් ආකාරයක පෙළඹවීමක් සිදුකිරීම තනතුරු සඳහා තෝරාගැනීමට නුසුදුසු කමක් ලෙස සලකනු ලැබේ.(ඒ ඒ තනතුරු සඳහා අදාළ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් හා අයදුම්පත්‍රය මේ සමඟ ඇමුණුම් කර ඇත.)

- **පුරප්පාඩුව පවතින තනතුරු**

| අනු අංකය | තනතුර | වැටුප් කේතය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | HM 1-1 | **01** |
| 2. | නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-1 | **03** |
| 3. | සහකාර අධ්‍යක්ෂ | MM 1-1 | **14** |
| 4. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) / සහකාර අධ්‍යක්ෂ (මුදල්) | MM 1-1 | **02** |
| 5. | නිකේතනාධිපති | MM 1-1 | **01** |
| 6. | ඉංජිනේරු (සිවිල්) | MM 1-1 | **01** |
| 7. | නිෂ්පාදක | JM 1-1 | **01** |
| 8. | වැඩපොළ අධිකාරී | JM 1-1 | **01** |
| 9. | පුහුණු කළමනාකරු | JM 1-1 | **02** |
| 10. | කාර්මික නිළධාරී | JM 1-1 | **01** |
| 11. | පරිපාලන නිළධාරී | JM 1-1 | **03** |
| 12. | අභ්‍යන්තර විගණන නිළධාරී | JM 1-1 | **01** |
| 13. | මූල්‍ය නිළධාරී | JM 1-1 | **03** |
| 14. | ප්‍රසම්පාදන නිළධාරී | JM 1-1 | **01** |
| 15. | ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිළධාරී | JM 1-1 | **06** |
| 16. | උපදේශන සේවා නිළධාරී | MA - 4 | **02** |
| 17. | කලා ශිල්පී (සංගීත / නැටුම්) | MA 2-1 | **07** |
| 18. | සහකාර පුස්තකාලායාධිපති | MA 2-1 | **01** |
| 19. | පොත් තබන්නා | MA 2-1 | **15** |
| 20. | නිශ්චල ඡායාරූප ශිල්පී | MA 2-1 | **01** |
| 21. | සහකාර නිෂ්පාදක | MA 2-1 | **01** |
| 22. | කාර්මික සහකාර | MA 2-1 | **01** |

| අනු අංකය | තනතුර | වැටුප් කේතය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 23. | ජාල දෘඩාංග කාර්මික ශිල්පී | MA 2-1 | **01** |
| 24. | ගොවිපොළ සහකාර | MA 2-1 | **04** |
| 25. | වෘත්තීය පුහුණු උපදේශක | MA 2-1 | **19** |
| 26. | පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී | MA 2-1 | **02** |
| 27. | කළමනාකරණ සහකාර | MA 1-1 | **70** |
| 28. | නිවාස පාලිකා | MA 1-1 | **11** |
| 29. | සහකාර තරුණ සේවා නිලධාරී | MA 1-1 | **52** |

- **කොන්ත්‍රාත් පදනමින් බඳවාගැනීම්**

| අනු අංකය | තනතුර | වැටුප් කේතය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | වෘත්තීය පුහුණු උපදේශක | MA 2-1 | **34** |
| 2. | ක්‍රීඩා උපදේශක | MA 2-1 | **01** |

- **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2021.05.03**

දමිත වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්/සභාපති
ජාතික තරුණ සේවා සභාව.
2021.04.          දින

<u>**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**</u>

**1. ප්‍රධාන අභ්‍යන්තර විගණක - - (HM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකාර සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර (05) ක අභ්‍යන්තර විගණනය පිළිබඳ ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වාණිජ්‍යා / ගණකාධිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

(i). අදාළ ක්ෂේත්‍රයකින් ලබාගත් පිළිගත් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

හෝ

(ii). ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. **(ICASL)**

හෝ

(iii). වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. **(CIMA)**

හෝ

(v) සහතිකකල සහ සමායතන ගණකාධිකාරින්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. **(ACCA)**

සහ

(ආ) උපාධිය/ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, කළමනාකාර මට්ටමේ මූල්‍ය / ගිණුම් පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහළොවක (15) පලපුරුද්දක් ලබා තිබීම.

- **HM 1-1 -** වැටුප් හා දීමනා.

HM 1-1 – 02/2016 : රු**: 80,295 – 15 X 2,270 – 114,345/-**

**2. සහකාර අධ්‍යක්ෂ - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 14**

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කණිෂ්ඨ කළමනාකරණ (JM 1-1) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ) (i). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

සහ

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, තරුණ සේවා සංවර්ධනය / ප්‍රජා සංවර්ධනය / සමූපකාර කටයුතු / ග්‍රාම සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**3.** සහකාර අධ්‍යක්ෂ (මුදල්) **- (MM 1-1) -** පුරප්පාඩු සංඛ්‍යාව 02

I. පහත සඳහන් හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කණිෂ්ඨ කළමනාකරණ (JM 1-1) සේවා ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර (05) ක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ) **(i)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල මාධ්‍ය / දෙමළ මාධ්‍ය) උපාධියක්** ලබා තිබීම.

හෝ

**(ii)** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම. **(ICASL-Intermediate Level).**

හෝ

**(iii)** වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම**. (CIMA).**

හෝ

**(iv)** වරලත් සහතිකකල සමායතන ගණකාධිකාරින්ගේ සංගමයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබිම. **(ACCA).**

හෝ

**(v)** රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකාරණය පිළිබඳ **උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය** ලබා තිබීම.

සහ

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, මූල්‍ය / ගිණුම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් **වසරක (01) සේවා පළපුරුද්දක්** ලබා තිබීම.

**4. ඉංජිනේරු (සිවිල්) - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

I. පහත සඳහන් භාහිර අයඳුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කණිෂ්ඨ කළමනාකරණ (JM 1-1) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- භාහිර අයඳුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **සිවිල් ඉංජිනේරු උපාධියක්** ලබා තිබීම.

සහ

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, සිවිල් ඉංජිනේරු කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් **වසරක (01) පලපුරුද්දක්** ලබා තිබීම.

**5. නිකේතනාධිපති - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

I. පහත සඳහන් භාහිර අයඳුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කණිෂ්ඨ කළමනාකරණ (JM 1-1) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- භාහිර අයඳුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **සංගීතය හෝ නර්තනය පිළිබඳ උපාධියක්** ලබා තිබීම.

සහ

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, සංගීතය හෝ නර්තනය හෝ පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් **වසරක (01) පලපුරුද්දක්** ලබා තිබීම.

- **MM 1-1 -** වැටුප් හා දීමනා.

MM 1- 1 – 02/2016 : රු**: 53,175 – 10 X 1,375 – 15 X 1,910 – 95,575/-**

## 6. වැඩපොල අධිකාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත විශේෂ උපදේශක / උපදේශක තනතුරක සේවය කර තිබීම. (අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සලකා බැලිය යුතුය.)

හෝ

III. ආශ්‍රිත නිළධාරි (MA - 3) සේවා ගණයේ වැටුප් ක්‍රමය යටතේ වැටුප් ලබන උපදේශක තනතුරක වසර (05) ක සේවා කාලයක් සපුරා තිබීම. (අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සලකා බැලිය යුතුය.)

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **සිවිල් ඉංජිනේරු / යාන්ත්‍රික ඉංජිනේරු / ස්වයංචලන ඉංජිනේරු උපාධියක්** ලබා තිබීම.

## 7. කාර්මික නිළධාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත කාර්මික නිළධාරී තනතුරක සේවය කර තිබීම. (අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සලකා බැලිය යුතුය.)

- අධ්‍යාපන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක්** ලබා තිබීම.

## 8. පුහුණු කළමනාකරු - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 02

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

I. කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත විශේෂ උපදේශක / උපදේශක තනතුරක සේවය කර තිබීම. (අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සලකා බැලිය යුතුය.)

හෝ

II. ආශ්‍රිත නිළධාරී (MA - 3) සේවා ගණයේ වැටුප් ක්‍රමය යටතේ වැටුප් ලබන උපදේශක තනතුරක වසර (05) ක සේවා කාලයක් සපුරා තිබීම. (අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සලකා බැලිය යුතුය.)

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **විද්‍යා හා තාක්ෂණය පිළිබඳ උපාධියක්** ලබා තිබීම

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි **(NVQ) හත් වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක්** අදාළ ක්ෂේත්‍රයකින්ලබා තිබීම.

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි **(NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක්** අදාළ ක්ෂේත්‍රයකින්ලබා තිබීම

සහ

උපාධිය / සුදුසුකම ලබා ගැනිමෙන් පසු රජයේ ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / පිළිගත් වාණිජ ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් **වසර පහ (05) ක සේවා පළපුරුද්දක්** ලබා තිබීම.

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි **(NVQ) පහ (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක්** අදාළ ක්ෂේත්‍රයකින්ලබා තිබීම

සහ

උපාධිය / සුදුසුකම ලබා ගැනිමෙන් පසු රජයේ ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / පිළිගත් වාණිජ ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් **වසර දහය (10) ක සේවා පළපුරුද්දක්** ලබා තිබීම.

**9. නිෂ්පාදක - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

I. පහත සඳහන් හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත සහකාර නිෂ්පාදක තනතුරක සේවය කර තිබීම.

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **කලා උපාධියක්** ලබා තිබීම.

**10. ප්‍රසම්පාදන නිළධාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත කළමනාකරණ සහකාර තනතුරක සේවය කර තිබීම.

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **උපාධියක්** ලබා තිබීම. විෂයක් වශයෙන් සැපයීම් ඇතුලත් වීම.

**11. මූල්‍ය නිළධාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 03**

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත පොත් තබන්නා තනතුරක සේවය කර තිබීම.

හෝ

III. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත කළමනාකරණ සහකාර තනතුරක සේවය කර තිබීම. (අ.පො.ස. උ/පෙළ වාණිජ්‍ය හෝ ගිණුම්කරණය විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.)

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල / දෙමළ මාධ්‍ය) උපාධියක්** ලබා තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම.

**(ICASL-Intermediate Level)**

හෝ

**(iii)** වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම **(CIMA).**

හෝ

**(iv)** වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම. **(ACCA).**

හෝ

**(v)** රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකරණය පිළිබඳ **උසස් ජාතික ඩිප්ලෝමා සහතියක්** ලබා තිබීම.

**12.** අභ්‍යන්තර විගණන නිළධාරී **- (JM 1-1) -** පුරප්පාඩු සංඛ්‍යාව 01

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

**II.** කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත පොත් තබන්නා තනතුරක සේවය කර තිබීම.

හෝ

**III.** කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත කළමනාකරණ සහකාර තනතුරක සේවය කර තිබීම. (අ.පො.ස. උ/පෙළ වාණිජා හෝ ගිණුම්කරණය විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.)

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

**(i)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල / දෙමළ මාධ්‍ය) උපාධියක්** ලබා තිබීම.

හෝ

**(ii)** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම. **(ICASL-Intermediate Level)**

හෝ

**(iii)** වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම **(CIMA).**

හෝ

**(iv)** වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම. **(ACCA).**

හෝ

**(v)** රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකරණය පිළිබඳ **උසස් ජාතික ඩිප්ලෝමා සහතියක්** ලබා තිබීම.

**13. පරිපාලන නිළධාරි - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 03**

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

**II.** කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සහිත කළමනාකරණ සහකාර තනතුරක සේවය කර තිබීම.

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් මානව සම්පත් / පරිපාලන ක්ෂේත්‍රයක **උපාධියක්** ලබා තිබීම.

(ආ). උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / පිළිගත් වාණිජ ආයතනයක මානව සම්පත් / පරිපාලන / විභාග ක්ෂේත්‍රයට අදාල අවම වශයෙන් **වසරක (01) පළපුරුද්දක්** ලබා තිබීම.

14. **ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිළධාරී (දිස්ත්‍රික්) - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 06**

ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ (MA-3) **තරුණ සේවා නිලධාරි** තනතුරෙහි අවම වශයෙන් වසර පහක (05) තරුණ සේවා කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ (MA 1 – 1), **II වන ශ්‍රේණියේ සහකාර තරුණ සේවා නිළධාරී** තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක අදාළ ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ (MA 1 – 1), **තරුණ සේවා නිළධාරී II වන ශ්‍රේණියේ** තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **JM 1-1 -** වැටුප් හා දීමනා.

JM 1- 1 – 02/2016 : රු**: 42,600 – 10 X 755 – 18 X 1,135 – 70,580/-**

**15.** උපදේශන සේවා නිළධාරී **- (MA - 4) - පුරප්පාඩු සංඛ්‍යාව 02**

I. පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

**II.** කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) සේවා ගණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

**III.** කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **අධ්‍යාපනය / සමාජ විද්‍යාව පිළිබඳව උපාධියක්** ලබා තිබීම.

- **MA - 4 -** වැටුප් හා දීමනා.

MA - 4 – 02/2016 : රු**:37,970 – 10 X 755 – 15 X 930 – 5 X 1,135 – 65,145/-**

**16.** කලා ශිල්පී (සංගීත / නැටුම්) **- (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 07**

**I. තනතුරට අදාළව පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

**1 (i). කලා ශිල්පී (සංගීත)**

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **අදාළ ක්ෂේත්‍රයේ** ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) පහ (05)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

**සංගීතය පිළිබඳ ලලිතකලාවේදී ඩිප්ලෝමා සහතිකය** ලබා තිබීම.

හෝ

**භාත්කණ්ඩේ අවසාන විභාගය (විශාරද අවසාන)** සමත් වී තිබීම.

හෝ

**ගාන්ධර්ව අවසාන විභාගය** සමත් වී තිබීම.

හෝ

**බටහිර සංගීතය පිළිබඳ රාජකීය** හෝ **ත්‍රිත්ව විභාගය 05** වන මට්ටම සමත් වී තිබීම.

හෝ

**අන්නාමලේ විශාරද විභාගය** සමත් වී තිබීම.

**(ii). කලා ශිල්පී (නැටුම්)**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **අදාළ ක්ෂේත්‍රයේ** ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) පහ (05)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

**නැටුම් පිළිබඳ ලලිතකලාවේදී ඩිප්ලෝමා ඩිප්ලෝමා සහතිකය** ලබා තිබීම**.**

හෝ

**භාත්කණ්ඩේ** අවසාන **විභාගය (විශාරද අවසාන)** සමත් වී තිබීම**.**

හෝ

**ගාන්ධර්ව අවසාන විභාගය** සමත් වී තිබීම.

හෝ

**අන්නාමලේ විශාරද විභාගය** සමත් වී තිබීම.

**17. සහකාර පුස්තකාලායාධිපති - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

**I. තනතුරට අදාළව පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **පුස්තකාල හා විඥාපන විද්‍යාව** පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) පහ (05)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**18. සහකාර නිෂ්පාදක - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

**I. තනතුරට අදාළව පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **ලේඛන කලාව සහ සන්නිවේදන (Writer Ship and Communication) ක්ෂේත්‍රයට** අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, **ඩිප්ලෝමා සහතිකය** ලබා තිබිම.

**19. කාර්මික සහකාර (විද්‍යුත් / සිවිල් / විදුලි) - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

**I. තනතුරට අදාළව පහත සඳහන් හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

**(i). කාර්මික සහකාර (සිවිල්)**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **සිවිල් ක්ෂේත්‍රයට** අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබිම.

**(ii). කාර්මික සහකාර (විදුලි)**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **විදුලි ක්ෂේත්‍රයට** අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබීම.

**(iii). කාර්මික සහකාර (විද්‍යුත්)**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට** අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබිම.

**20. ජාල දෘඩාංග කාර්මික ශිල්පී - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

**I. තනතුරට අදාළව පහත සඳහන් හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **ජාල දෘඩාංග කාර්මික ශිල්පයට** අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ)** පහ **(05)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**21.** ගොවිපල සහකාර - **(MA 2-1)** - පුරප්පාඩු සංඛ්‍යාව 04

**I. තනතුරට අදාළව පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **කෘෂිකර්ම ක්ෂේත්‍රයට** අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා **(NVQ) 05** වන මට්ටමට නොඅඩු, **කෘෂිකාර්මික ඩිප්ලෝමා සහතිකය** ලබා තිබීම.

**සටහන:** කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙහෙයවන (මාස 06 ක) ප්‍රායෝගික පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස නිම කර තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**22.** වෘත්තීය පුහුණු උපදේශක - **(MA 2-1)** - පුරප්පාඩු සංඛ්‍යාව 19

**I. තනතුරට අදාළව පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත්, **සිවිල් / විදුලි / ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට** අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, **තාක්ෂණවේදය (NDT)** පිළිබඳ **ජාතික ඩිප්ලෝමා සහතිකයක්** ලබා තිබීම.

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද, **සිවිල් / විදුලි / ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට** අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, **ඉංජිනේරු විද්‍යාව (NDES)** පිළිබඳ **ජාතික ඩිප්ලෝමා සහතිකයක්** ලබා තිබිම.

හෝ

තෘතියික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **කෘෂිකර්ම / ක්‍රීඩා / කාර්මික / වායු සමීකරණ / ආලෝකකරණ / පෙදරේරු / ජල නළ / වඩු වැඩ / තොරතුරු තාක්ෂණය / වෙනත් අදාළ ක්ෂේත්‍රයක** ජාතික වෘත්තිය යෝග්‍යතා **(NVQ) 05** වන මට්ටමට නොඅඩු සහතිකයක් ලබා තිබිම.

**23.** පරිගණක චිත්‍රක නිර්මාණ ශිල්පී - **(MA 2-1)** - පුරප්පාඩු සංඛ්‍යාව 02

**I. තනතුරට අදාළව පහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **තොරුතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පයට** අදාළව පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පය විෂයක් වශයෙන් ඇතුලත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) පහ (05)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**24. නිශ්චල ඡායාරූප ශිල්පී - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

**I. තනතුරට අදාළව පහත සඳහන් හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **නිශ්චල ඡායාරූපකරණයට** අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) පහ (05)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**25. පොත් තබන්නා - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 15**

**I. තනතුරට අදාළව පහත සඳහන් හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.**

- හාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ **ක්ෂේත්‍රයකින්** කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) පහ (05)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- වැටුප් හා දීමනා.

MA 2-1 – 02/2016: රු**: 30,310 – 10 X 300 – 07 X 350 – 04 X 495 – 20 X 660 – 50,940/-**

**26. කළමනාකරණ සහකාර - (MA 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 70**

- හාභිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ). සිංහල / දෙමළ හා ගණිතය ද, තවත් විෂයන් 02 ක් ද ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ). අ.පො.ස.(උ. පෙ.) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයන් 03 කින් සමත්ව තිබීම.

**27. සහකාර තරුණ සේවා නිළධාරී - (MA 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 52**

- හාභිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ). සිංහල / දෙමළ හා ගණිතය ද, තවත් විෂයන් 02 ක් ද ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ). අ.පො.ස.(උ. පෙ.) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයන්03 කින් සමත්ව තිබීම.

**(ඇ). තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්**

ජාතික කරුණ සේවා සභාවේ යෞවන සමාජ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස අවම වශයෙන් වසර දෙකක් (02) වත් කටයුතු කර තිබීම.

**28. නිවාස පාලිකාව - (MA 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 11**

- හාභිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ). සිංහල / දෙමළ හා ගණිතය ද, තවත් විෂයන් 02 ක් ද ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ). අ.පො.ස.(උ. පෙ.) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයන්03 කින් සමත්ව තිබීම.

**(ඇ). තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්**

රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / ප්‍රකට වාණිජ ආයතනයක පාලිකාවක සේ අවම වශයෙන් වසර දෙකක පලපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

(අ). ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය, සහ ශිල්පීය සේවා ගණයන්හි පහත **'අ' 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම්** ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කල හැකිය.

(ආ). සිංහල / දෙමළ හා ගණිතය ද, තවත් විෂයන් 02 ක් ද ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්වීම.

(ඇ). සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ). නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්න කොට තිබිය යුතුය.

01. කළමනාකරණ සහකාර

පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාල අවස්ථාවන්හි දී සුදුසුකමක් වශයෙන් ගනු ලැබේ.

සටහන :

යම් තනතුරකට ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත ආ ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත ආ ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

- MA 1-1 වැටුප් හා දීමනා.

MA 1-1 – 02/2016: රු**: 27,910 – 10 X 300 – 07 X 350 – 04 X 495 – 20 X 660 – 48,540/-**

***02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2021 වර්ෂයේ පත්වීම් ලබන දින සිට ඉහත වැටුප් පරිමාණයට හිමිකම් ලබන අතර, තනතුරට අදාලව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2012.05.03

**සේ:අ:අංකය:-**

**<u>ආදර්ශ අයදුම් පත්‍රය</u>**

| |
|---|
| |

අයදුම්කරන තනතුර:-.................................................. (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

**<u>ජාතික තරුණ සේවා සභාවේ ඇබෑර්තුව පවතින .................................................. තනතුර සඳහා බඳවා ගැනීම</u>**

**01.**

1.1. අයදුම්කරුගේ මුලකරු සමග නම :- ........................................................................................

1.2. සම්පූර්ණ නම : - ................................................................................................................

1.3. ජාතික හැඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.4. ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☐

පුරුෂ ☐

1.5. සේවා ස්ථානය :- ...............................................................................................................

**02.**

2.1. ස්ථිර ලිපිනය :- .................................................................................................................

2.2. දුරකථන අංකය :-..............................................................................................................

**03.** ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම්:-......................................

- අ:පො:ස: (සා/පෙළ) වර්ෂය:................................... විභාග අංකය:....................................

| විෂය | නිපුණතා මට්ටම |
|---|---|

| | |
|---|---|
| | |

- අ:පො:ස: (උ/පෙළ) වර්ෂය:................................. විභාග අංකය:..................................

| විෂය | නිපුණතා මට්ටම |
|---|---|
| | |

3.1. වෘත්තීය සුදුසුකම් :-

| පාඨමාලාවේ නම | නිපුණතා මට්ටම | ආයතනය |
|---|---|---|
| | | |

**04.** ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේද ? (අදාල කොටුවේ ( √ ) ලකුණ යොදන්න)

| ඔව් | |
|---|---|

| නැත | |
|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇති ද යන තොරතුරු සපයන්න :- ......................................................................................................................

**05**. අ.යදුම්කරුගේ සහතිකය:-

(අ) . මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තවද මෙහි සියළුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) . මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වූවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසුව වූව ද තනතුරෙන් ඉවත්කිරීමට යටත් වන බවත් මම දනිමි.

(ඇ). මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

....................................

දිනය :- ..................................                                        අයදුම්කරුගේ අත්සන

**06.** ආසන්නතම අධීක්ෂණ නිළධාරියාගේ නිර්දේශය:-

............................................. සේවයේ නියුතු ......................................................................... මයා/මිය/මෙනවිය......................................තනතුර දරණ නිළධාරියෙකු බවත්, ඔහු/ඇය/ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. එසේම ඔහු/ඇයගේ රාජකාරී විනය/හැසිරීම හා පැමිණීම යහපත්/අයහපත් බව නිර්දේශ කරමි.

.......................................................

අත්සන හා නිළ මුද්‍රාව

නම :-.........................................

තනතුර :-........................................

දිනය :-........................................